# ශ්‍රී වංගීස වංසාලන්කාර විපස්සනා කම්මට්ඨානාචරිය පූජ්‍ය තපෝවනයේ නිවාත ස්වාමින් වහන්සේ



ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල බල ප්‍රදේශයේ වේයන්ගොඩ මාළිගාතැන්න ග්‍රාමයේ දී 1951 අගෝස්තු මස 11 වෙනි දින උපත ලබා ගමේ පන්සලේ පිහිටි ප්‍රාථමික පාසැලෙන් මූලික අධ්‍යාපනයත්, වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලයෙන් උසස්පෙළ අධ්‍යාපනයත් ලබා කොළඹ කලපළුවාවේ පිහිටි ගෝතම තපෝවනයේදී 1971 වර්ෂයේ වෙසක් පුර පසළොස්වක පෝය දින පැවිදි වූ පූජ්‍ය තපෝවනයේ නිවාත හිමිපාණන් හට ආචායර්‍ය උපාධ්‍යායන් වහන්සේ වූයේ ගෝතම තපෝවනය ඇතුළු ශාඛා මධ්‍යස්ථාන නිර්මාතෘ ශ්‍රී කල්‍යානිවංශ නිකායේ අධිකරණ සංඝනායක කම්මට්ඨානාචාර්ය අතිපූජ්‍ය කුඩාවැල්ලේ වංගීස නායක ස්වාමින් වහන්සේය. මහනුවර කටුගස්තොට ධර්මරාජ පිරිවෙනෙන් පිරිවෙන් අධ්‍යාපනයත්, ගැරුදේව නායක ස්වාමින් වහන්සේ සහ ශ්‍රී කල්‍යානිවංශ නිකායේ වර්ථමාන මහානායක අතිපූජ්‍ය දෙඩම්පහල චන්ද්‍රසිරි ස්වාමින් වහන්සේගෙන් ධර්ම විනයත්, ගුරුදේව නායක ස්වාමින් වහන්සේ, කඳුබොඩ භාවනා මධ්‍යස්ථානාධිපති අපවත්වී වදාළ අතිපූජ්‍ය කහටපිටියේ සුමතිපාල නායක ස්වාමින් වහන්සේ සහ අපවත්වී වදාළ අතිපූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රී මහානායක ස්වාමින් වහන්සේගෙන් භාවනා පුහුණුවත් ලබාගත්හ.

1975 ජූලි මස 10 වෙනි දින ශ්‍රී කල්‍යානිවංශ නිකාය මූලස්ථානය වන දෙඩන්දූව ශෛලබිම්බාරාම මහා විහාරයේ උදකුක්ඛප සීමාවේදී චන්ද්‍රකීර්ති මෙධාශ්‍රී දෙවිනුවර අමරසිරි මහානායක මා හිමිපාණන් උපාධ්‍යායව කල්‍යානිවංශ නිකායේ අධිකරණ සංඝනායක කම්මට්ඨානාචාර්ය අතිපූජ්‍ය කුඩාවැල්ලේ වංගීස නායක ස්වාමින් වහන්සේ ආචායර්‍යව උතුම් උපසම්පදාව ලබාගත්තේය.

කෑගල්ල අභයභූමි තපෝවනය පිහිටුවා වසර අටක් ගෙවී ගියත් පිරිහෙමින් පැවති එම තපෝවනය පවත්වා ගෙනයාම පිණිස සුදුසු ස්වාමින් වහන්සේනමක් වැඩමවා ගැනීමට එහි දායක පිරිස නිතරම නාහිමිපාණන් වහන්සේ වෙත ඉල්ලීම්

කළහ. නිවාත හිමියන්ගේ දක්ෂතා හඳුනාගත් නායක ස්වාමින් වහන්සේ කෑගල්ල අභයභූමි තපෝවනයට වැඩම කරන මෙන් දන්වා සිටියේය.

ගුරුදේව නායක හිමිපාණන් වහන්සේගේ ඉල්ලීමට අනුව 1976 ජනවාරි මස දෙවෙනි දින කෑගල්ල තපෝවනයට වැඩම කළ උන්වහන්සේට දකින්න ලැබුනේ කිසිම ස්ථිර ගොඩනැගිල්ලක්, පාරක් තොටක්, ජල පහසුකමක්, විදුලිය, හෝ කැපකරුවෙක්වත් නොමැති තාවකාලිකව ඉදිකරන ලද පොල් අතු සෙවිලි කළ මඩු කීපයක් පමණි. කොළඹ මූලස්ථානයේ සැපපහසු පරිසරයක වැඩ විසූ උන්වහන්සේට මෙය විශාල අභියෝගයක් විය. කටු කෙහෙළින් විෂකුරු සතුන්ගෙන් පිරි වනරොදක තනිව ගත කිරීම බිහිසුණු අත්දැකීමකි. සිය දහස් වර ආපසු තපෝවනයට වැඩම කිරීමට සිතුවිලි පහලවූ නමුත් තමාටම අවවාද කරගෙන නායක ස්වාමින් වහන්සේ තැබූ විශ්වාසය රැක ගැනීමට ඉතා දුස්කර ජීවිතයට හුරු-පුරුදු විය.

රත්නත්‍රයට ජීවිතය පූජාකර උට්ඨානවීර්ය, අධිෂ්ඨානය සහ කැපවීමෙන් ක්‍රියා කිරීම නිසා පූජ්‍ය නිවාත ස්වාමින් වහන්සේ ආරම්භ කළ සියලු ලෝක ශාසනික සේවා මල්ඵල දරන්නට විය. එම ලෝක ශාසනික සේවා පිළිබඳව තපෝවන ඉතිහාසයෙන් වැඩිදුර ඔබට බලාගතහැකිය.

ජීවිතයේ අඩකටත් වැඩි කාලයක් කෑගල්ල අභයභූමි තපෝවනයේ වැඩ වසමින් සිදුකරන සේවාවන් පිළිබඳව ප්‍රසාදයටපත් ස්ව නිකායික මහා සංඝරත්නය 1991 වසරේ දී ශ්‍රී වංගීස වංසාලන්කාර විපස්සනා කම්මට්ඨානාචරිය යන ගෞරව නාම සහිත සබරගමුව පළාතේ උපප්‍රධාන සංඝනායක පදවිය පිරිනැමූහ. නැවත 2010 වසරේ ශ්‍රී කල්‍යානිවංශ නිකායේ කර්මාචාර්‍යය පදවියක් සහ විදයක කාරක සංඝ සභාවටද උන්වහන්සේ පත්කර ගත්හ.